පොලිස්පතිතුමා,

පොලිස් මූලස්ථානය,

කොළඹ 01.
2022.04.20

**<u>2019.04.21 දින එනම්, පාස්කු ඉරුදින සිදු වූ බෝම්බ ප්‍රහාරය සිදු වන බවට තොරතුරු ලැබී තිබිය දී එකී තොරතුරු වල සඳහන් වරද සිදු කිරීම වැළැක්වීමට ක්‍රියා කිරීම නීති විරෝධිව නොකර හැරීමෙන්, වරදක් සිදු කරන ලද ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දීගොඩගමගේ නිලන්ත ජයවර්ධන මහතාව අත්අඩංගුවට ගන්නා ලෙස ඉල්ලා ඉදිරිපත් කරන පැමිණිල්ලයි.</u>**

ශ්‍රී ලංකා ජනරජයේ මිත් මතුවට නම් සඳහන් අප නීති ගරුක සහ වගකීම් සහගත පුරවැසියන් වශයෙන් සහ මෙම සිදුවීමෙන් අගතියට පත් පාර්ශවයක් ලෙස ශ්‍රී ලංකාවේ සාක්ෂි ආඥාපනත ප්‍රකාරව දිවුරුම් පිට ලබාදෙන ලද සාක්ෂි සහ දිවුරුම් ප්‍රකාශ වල සහතික පිටපත් ඉදිරිපත් කරමින් මෙසේ පැමිණිලි කර සිටිමු.

ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දීගොඩගමගේ නිලන්ත ජයවර්ධන විසින් ඔහු රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් සිටිමින් 2019.04.21 දින සිදු වූ පාස්කු ඉරු දින බෝම්බ ප්‍රහාරය එල්ල වන බවට ඔහුට තොරතුරු ලැබී තිබියදීත් එම තොරතුරු, බුද්ධි තොරතුරු බවට පරිවර්තනය කර ගැනීම පැහැර හැරීමෙන් හා ඒ පිළිබඳ වැඩිදුර විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය බලධාරීන් යොමු කිරීමේ මූලික වගකීම පැහැර හැරීමෙන් එම ත්‍රස්ත ප්‍රහාරය වලක්වා ගැනීමට ක්‍රියා කිරීම නීති විරෝධිව නොකර හැරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ (iii) වන ශීර්ෂයේ සඳහන් වරදක් සිදු කර ඇත. මෙම වරද සිදු කිරීම හේතුකොට ගෙන 2019 අප්‍රේල් මස 21 දින පාස්කු ප්‍රහාරය සිදු වූ අතර ඒ හේතුවෙන් පුද්ගලයින් 267 ක් මිය ගොස් 400 කට අධික ප්‍රමාණයක් තුවාල ලබන ලදී. මේ සම්බන්දයෙන් HC (TAB) 2899/2021 සහ HC (TAB) 2900/2021 දරණ ත්‍රිපුද්ගල මහාධිකරණ නඩු විභාගයන් ද්විත්වයේදී සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කොට ඇති (F/R) No 64/22 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේදී ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දීගොඩගමගේ නිලන්ත ජයවර්ධන මහතාගේ වරදකාරිත්වය හැගවෙන සාක්ෂි රැසක් ඉදිරිපත් වී ඇත. එසේ ඉදිරිපත් වී ඇති සාක්ෂි වලින් යම් ප්‍රමාණයක් ඔබගේ විමර්ශන වල පහසුව සඳහා මෙසේ දක්වා සිටින්නෙමු.

<u>ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දීගොඩගමගේ නිලන්ත ජයවර්ධන මහතාට එරෙහිව ඇති සාක්ෂි</u>

HC (TAB) 2899/2021 දරණ නඩුවේදී පැමිණිල්ලේ සාක්ෂිකරුවකු වූ හිටපු යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක වුල කොඩිතුවක්කු විසින් සාක්ෂි ලබාදෙමින් කියා සිටියේ එම නඩුවේ පැ 8 දරණ 2019.04.04 දින ලද 'වට්සැප්' පණිවිඩය රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාව සිටි නිලන්ත ජයවර්ධන මහතා හට ලැබුණු ඉතා වැදගත් තොරතුරක් වුවද, ඒ පිළිබඳව 2009.04.09 වන දින පැවති බුද්ධි සමාලෝචන රැස්වීමේදී අවධානය යොමු කිරීමට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාව සිටි නිලන්ත ජයවර්ධන මහතා පැහැර හරින නමුත් එම කාරණාව ඉදිරිපත් කිරීම සහ සාකච්චා කිරීම සඳහා හොඳම සහ සුදුසුම ස්ථානය බුද්ධි සමාලෝචන මණ්ඩලය බවයි.

පැ 8 දරණ 2019.04.04 දින නිලන්ත ජයවර්ධන මහතා හට ලැබුණු 'වට්ස්ඇප්'පණිවිඩයේ සිංහල පරිවර්තනය

*"ලැබුණු තොරතුරකට අනුව ශ්‍රී ලංකාවේ ජාතික තව්හිඩ් ජාමත් සංවිධානයේ සහරාන් හෂීම් සහ ඔහුගේ සහචරයින් ළඟදීම ශ්‍රී ලංකාවේ මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාරයක් එල්ල කිරීමට සැලසුම් කර තිබේ. ඔවුන් වැදගත් දේවස්ථාන කිහිපයක් ඉලක්ක කිරීමට සැකසුම් කරති. ඔවුන් ශ්‍රී ලංකාවේ ඉන්දීය මහා කොමසාරිස් කාර්යාලයේ ඔත්තු බැලීම් සිදුකර ඇති අතර එය සැලසුම් සහගත ප්‍රහාරයේ එක් ඉලක්කයක් බව තවදුරටත් දැනගන්නට ඇත.*

*2. අදාළ තොරතුර මගින් ත්‍රස්තවාදියා පහත සදහන් ඕනෑම ප්‍රහාර ක්‍රමයක් අනුගමනය කළ හැකි බව පෙන්නුම් කරයි.*

*අ. මරාගෙන මැරෙන ප්‍රහාර*

*ආ. ආයුධ යොදාගෙන එල්ලකරන ප්‍රහාර*

*ඇ. පිහි ප්‍රහාර*

*ඈ ට්‍රක් රථ ප්‍රහාර*

*3. සැලසුම් සහගත මරාගෙන මැරෙන ත්‍රස්ත ප්‍රහාරයේ කණ්ඩායම් සාමාජිකයින් පහත දැක්වෙන අය බව ද දැනගන්නට ඇත.*

*i. සහරාන් හෂීම්*
*ii. ජල් අල් කිතල්*
*iii. රිල්වාන්*
*iv. සජිඩ් මවුලවි*
*v. ෂාහිඩ්*
*vi. මිල්හාන් සහ තවත් අය*

*මෙම තොරතුරු දැක්වීම සඳහා ප්‍රමුඛතාවය ලබාදී කටයුතු කරනු ඇතැයි ද අපට ඒ පිළිබද ප්‍රතිචාරයක් ලබාදීමට කාරුණික වනු ඇතැයි ද බලාපොරොත්තු වෙමු".*

මෙම නඩුවේ 2021.12.13 පෙ.ව 11.35 සටහනේ 7 සහ 8 පිටු වල අඩංගු ඉහත සදහන් හිටපු යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක වූල කොඩිතුවක්කු මහතාගේ සාක්ෂිය පහත දැක්වෙන අතර එම දිනයට සහ වේලාවට අදාළ සටහන් **"A"** ලෙසත් එම අදාළ සාක්ෂි කොටස ඇති පිටුව **"A (1)"** ලෙසත් ලකුණු කොට මෙයට අමුණා ඇත.

"ප්‍ර. එතකොට එතැනදී SIS එක ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාගේ කර්තව්‍ය මොකද්ද, සාමාන්‍යයෙන් ඒ වගේ වේලාවේදී බුද්ධි සමාලෝචන මණ්ඩලය තුළ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාගේ කර්තව්‍ය මොකද්ද?

උ. සාමාන්‍යයෙන් බුද්ධි සමාලෝචන වාර්තාව කමිටුවක පත්වන්නේ සාමාන්‍යයෙන් ඒක සම්පූර්ණයෙන්ම සාකච්ඡා කරන්නේ බහුල වශයෙන් බුද්ධි තොරතුරු. එතකොට මේ බුද්ධි තොරතුරු සාකච්ඡා කිරීමේදී පලවෙනි ඉදිරිපත් කිරීම, බුද්ධි තොරතුරු ප්‍රසන්ටේෂන් එක ඉදිරිපත් කිරීම කරන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක විසින්.

ප්‍ර. රාජ්‍ය බුද්ධි සේවයේ ඒ කියන්නේ SIS එකේ අධ්‍යක්ෂක?

උ. SIS ඩිරෙක්ටර් ස්වාමිණි.

ප්‍ර. එයා තමයි මූලිකවම කරන්නේ?

උ. පළවෙනි විග්‍රහය කරන්නේ ස්වාමිණි.

ප්‍ර. එතකොට මහත්තයා කිව්වා 2019 අප්‍රේල් 09 වෙනිදා බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමක් තිබුණා කියලා?

උ. එසේයි ස්වාමිණි.

ප්‍ර. එතකොට අප්‍රේල් 09 වෙනිදා බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමේදී එතකොට රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වන නිලන්ත ජයවර්ධන මහත්මයාත් සහභාගී වෙලා තිබුණා කියලා මහත්තයාට මතකයක් තියෙනවද?

උ. එසේයි ස්වාමිණි. සහභාගී වුනා ස්වාමිණි.

..........

ප්‍ර. එතකොට නිලන්ත ජයවර්ධන මහත්තයා නමින් නෙමෙයි ඒ කියන්නේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා හැටියට තමුන්ගේ ඉදිරිපත් කිරීම කරන අවස්ථාවේදී මේ තොරතුර පැ.8 දරණ ලේඛනයේ සඳහන් තොරතුර ඒ වේලාවේ බුද්ධි සමාලෝචන මණ්ඩලයට ඉදිරිපත් කළාද?

උ. නැහැ ස්වාමිණි. මට හොඳ මතකයක් තිබෙනවා ඒක ඉදිරිපත් කළේ නැහැ කියලා ස්වාමිණි.

ප්‍ර. එවැනි තොරතුරු ඒ වගේ මහත්මයා කියන්නේ මේක ඉතා වැදගත් තොරතුරක් කියලා පැ. 8 සහ පැ. 15 පස්සේ ආපු එකක්, පැ. 8 දරණ තොරතුරු ඒ බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට මොනවා හරි බාධාවක් තිබෙනවද? දැන් මහත්මයාගේ ඒ කියන්නේ මේක ආරක්ෂාව මේ වගේ දේවල් කතා නොකළ යුතු දෙයක් හැටියට ඒ වගේ මොනවා හරි බාධකයක් තිබෙනවාද එවැනි සමාලෝචන මණ්ඩලයට සාකච්ඡා කරන්න?

උ. ස්වාමිණි. මම හිතන්නේ නැහැ එහෙම බාධාවක් තිබෙනවා කියලා මොකද ඒක තමයි හොඳම සහ සුදුසුම ස්ථානය. ඒ වගේ විශේෂ බුද්ධි තොරතුරක් ගැන සාකච්ඡා කරන්න. මොකද ඒක එකක් විශේෂයෙන්ම එතන සේරම විශ්වාසවන්ත පුද්ගලයෝ ඉන්නේ මොකද අපි අධ්‍යක්ෂකවරුන් විදිහට ඒ විශ්වාසවන්තභාවය උපරිමයෙන් තියෙන නිසා තමයි ස්වාමිණි පත් කරන්නේ. ඊට අමතරව මෙතන ආරක්ෂාව සම්බන්ධයෙන් විශාල පළපුරුද්දක්, දැනුමක් තිබෙන අයවලුන් කිහිප දෙනෙක්ම හිටියා. ඒ ඔතැන හමුදාපතිලා තුන්දෙනා. පොලිස්පති. ඉතින් මම හිතන්නේ අවධානය යොමු කළ යුතු ඉහළම තලයේ පුද්ගලයින් ආරක්ෂාව සම්බන්ධයෙන් එතැන ඉන්න තැනක්. ඉතින් ඒක මම හිතන්නේ හොඳ ම අවස්ථාව කියලා ඒ වගේ දෙයක් සාකච්ඡා කරන්න ස්වාමිණි."

තවද 2019.04.04 දින ලද තොරතුර ඇතුලු තොරතුරු වර්ධනය කරගෙන එහි සත්‍ය අසත්‍යතාවය හෝ එවැන්නක් සිදු වීමට ඇති සම්භාවිතාවය පිළිබඳ අවශ්‍ය අනෙකුත් අය සමග සාකච්ඡාවට බඳුන් කිරීමේ මූලික වගකීම රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් නිලන්ත ජයවර්ධන මහතා සතුව තිබුණු

බව වුල කොඩිතුවක්කු මහතාගේ සාක්ෂියෙන් පෙනී යයි. මෙම නඩුවේ 2021.12.13 පෙ.ව 11.50 සටහනේ 3 සහ 4 පිටු වල අඩංගු හිටපු යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක වුල කොඩිතුවක්කු මහතාගේ එම සාක්ෂිය පහත දැක්වෙන අතර එම දිනයට සහ වේලාවට අදාළ සටහන් **"B"** ලෙසත් එම අදාළ සාක්ෂි කොටස ඇති පිටුව **"B (1)"** ලෙසත් ලකුණු කොට මෙයට අමුණා ඇත.

*"ප්‍ර. එතකොට මහත්මයා බුද්ධි අධ්‍යක්ෂක ජනරාල්වරයා හැටියට යුධ හමුදාවේ ඍජු ලෙස බුද්ධි ප්‍රධානිට ලියන්නේ නැතිව ආරක්ෂක ලේකම්වරයා මගින් ජාතික බුද්ධි ප්‍රධානීගේ අවධානය යොමු කරන්න හේතුව කුමක්ද ? මේ සෑම ලිපියකම තියෙන්නේ ආරක්ෂක ලේකම් (ජාතික බුද්ධි ප්‍රධානීගේ අවධානය සඳහා)?*

*උ. ඔව්.*

*ප්‍ර. එතකොට අපිට, මට යුධ හමුදාව හෝ ආරක්‍ෂක සැකැස්ම පිළිබඳ අවබෝධයක් නැති නිසා මම අහන්නේ?*

*උ. හොඳයි ස්වාමිණි.*

*ප්‍ර. එතකොට මට තේරෙන විදිහට මේ ලිපියෙන් බලාපොරොත්තු වෙලා තිබෙන්නේ මේ ලිපියේ තියෙන කරුණු අවධානය යොමු කල යුත්තේ ජාතික බුද්ධි ප්‍රධානීගේ අවධානය සඳහා කියලාද, ආරක්‍ෂක ලේකම්වරයාගේ අවධානය සඳහාද කියන එක පිළිබඳවද අපට දැනගන්න අවශ්‍යයි?*

*උ. ස්වාමිණි මම මේක තේරුම් කරන්නම් ස්වාමිනි. දැන් මේ සේරම බුද්ධි වාර්ථා ස්වාමිනි. බුද්ධි වාර්ථා සාමාන්‍යයෙන් යන්න ඕන ආයතනයේ ප්‍රධානී අතට තමයි ස්වාමිනි. මොකද ඒවා තමයි රහසිගත සංවේදී තොරතුරු ඇතුලත් වාර්ථා ස්වාමිනී. එතකොට මේ වාර්ථා යවන කොට අවධානය යොමු වෙච්ච පුද්ගලයා තමයි ආරක්ෂක ලේකම්. අවසාන වශයෙන් අවධානය යොමු වෙච්ච පුද්ගලයා. නමුත් ජාතික බුද්ධි ප්‍රධානී විදිහට ඔහු තමයි ඔහු කරන්නේ සම්බන්ධීකරණය සහ ඔහුට හැම බුද්ධි ආයතනයක්ම එන තොරතුරු ඔහු ළඟ තිබෙනවා ස්වාමිනී. එතකොට දැන් මම යවන බුද්ධි තොරතුර මම යවන්නේ දැන් ලියුමේ ඔය විදිහට සටහන් කරලා Envelop එකේ ලියුම් කවරේ අපි ලියන්නේ ජාතික බුද්ධි ප්‍රධානීගේ නමට තමයි යවන්නේ ස්වාමිනී. එතකොට මේක විවෘත කරන්නේ ජාතික බුද්ධි ප්‍රධානී. ඒක විවෘත කරලා ඒකේ තියෙන තොරතුරු අරගෙන ඔහුගේ තියෙන මූලික බුද්ධි තොරතුරු එක්ක යොමු කරලා වඩාත් හොඳ බුද්ධි වාර්ථාවක් විදිහට ආරක්ෂක ලේකම්තුමා වෙත යොමු කිරීමේ අරමුණ ඇතිව තමයි ස්වාමීනි අප එහෙම කරන්නේ"*

තවද මෙම නඩුවේදී වුල කොඩිතුවක්කු මහතා සාක්ෂි දෙමින් පවසා සිටියේ නිලන්ත ජයවර්ධන මහතා 2019.04.18 දින තමාට දුරකථනයෙන් කතා කරන ලද අවස්ථාවේදී මඩකලපුවේ සිදු වූ පිපිරීමක් සම්බන්ධයෙන් සාකච්චා කලද, 2019.04.04 දින ලද තොරතුර සම්බන්ධයෙන් කිසිදු දැනුම් දීමක් නොකළ බවයි. එමෙන්ම ඔහු වැඩිදුරටත් සාක්ෂි ලබාදෙමින් පවසා සිටියේ රාජ්‍ය බුද්ධි සේවය කිසිදු අවස්ථාවක බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමට උත්සහ නොකළ බවත්, යුධ හමුදා බුද්ධි අංශය සමග රාජ්‍ය බුද්ධි සේවය සහයෝගයෙන් කටයුතු නොකළ බවත් ය.

මෙම නඩුවේ 2021.12.13 පෙ.ව 11.50 සටහනේ 6 පිටුවේ අඩංගු බ්‍රිගේඩියර් වුල රත්නසිරි කොඩිතුවක්කු මහතාගේ සාක්ෂිය පහත දැක්වෙන අතර එම දිනයට සහ වේලාවට අදාළ සටහන් දැනටමත් "B" ලෙස ලකුණු කොට ඇති අතර එම අදාළ සාක්ෂි කොටස ඇති පිටුව **"B (2)"** ලෙස ලකුණු කොට මෙයට අමුණා ඇත.

*"හරස් ප්‍රශ්න*

*ප්‍ර. දැන් මහත්මයා මම මැදින් පටන් අරගන්නම්. මහත්මයා 2019 අප්‍රේල් මාසේ 18 වෙනිදා මේ රාජ්‍ය බුද්ධි අංශ ප්‍රධානී නිලන්ත ජයවර්ධන යන මහත්මයත් එක්ක දුරකතනයෙන් කතා කලාද?*

*උ. ඔව් රාජ්‍ය බුද්ධි සේවා අධ්‍යක්ෂක 18 මට කතා කලා දුරකතනයෙන් ස්වාමීනි.*

*ප්‍ර. අප්‍රේල් මාසේ 18 වෙනිදා?*

*උ. එසේය ස්වාමිනී.*

*ප්‍ර. ඒ කතා කලේ කුමක් සම්බන්ධයෙන්ද?*

*උ. ස්වාමිනී මට කතා කරලා ඇහුවේ මෙහෙම මඩකලපුවේ පිපිරීමක් සිදු වෙලා තිබෙනවා. ඒක දන්නවද කියලා ස්වාමීනී.*

*ප්‍ර. ඔය අප්‍රේල් මාසේ 18 වෙනිදා බෝම්බයක් පුපුරලා තියෙනවය එය දන්නවද කියලා ඇහුවා. නමුත් මේ ඔහුට 4 වෙනිදා අප්‍රේල් මාසේ ලැබුණු තොරතුර සම්බන්ධයෙන් කිසිම දෙයක් ඔබට දැනුම් දුන්නද?*

*උ. මට කිසිම දෙයක් දැනුම් දුන්නේ නැහැ ස්වාමිනී.*

*ප්‍ර. දැන් ඔබට මේ බෝම්බ පිපිරිම දැන ගන්න ලැබුණේ අප්‍රේල් මාසේ 21 වෙනිදා බෝම්බ පිපිරුණාට පස්සේ. පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් තමයි?*

*උ. ඔව්. පාස්කු ඉරිදා ප්‍රහාරයට සම්බන්ධව ප්‍රහාර මාලාව මට දැනගන්න හම්බ වුනේ ප්‍රහාරය සිදුවුණායින් පස්සේ ස්වාමිනී.*

*ප්‍ර. දැන් මහත්මයා දැන් මේ මහත්මයාගේ තනතුර ඒ අවස්ථාවේදී ඩී.එම්.අයි.* **Director of Military Interlligence?**

*උ. එසේය ස්වාමිනී."*

මෙම සාක්ෂි විශ්ලේෂණය කරමින් HC(TAB)2899/2021 දරණ නඩුවේදී එ.කේ.එම්. පටබැදිගේ විනිසුරුතුමා දක්වා ඇත්තේ 2019.04.04 දරණ තොරතුර බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය කරගැනීම සඳහා හෝ ඒ පිළිබඳ වැඩිදුර විශ්ලේෂණය කිරීම සඳහා නිලධාරීන් යොමු කිරීම පැහැර හැර ඇත්තේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා බවයි. HC (TAB)2899/2021 දරණ නඩුවේ 2022.02.18 දරණ නියෝගයේ 245 ඡේදයේ මෙය සඳහන් වන අතර එම ඡේදය අඩංගු නියෝගයේ මුල් පිටුවේ සත්‍ය පිටපතක් **"C"** ලෙසද 245 ඡේදය අඩංගු පිටුවේ සත්‍ය පිටපතක් **"C (1)"** ලෙස ලකුණු කොට මෙයට අමුණා ඇත.

***"245. ... 2019.04.04** ලද වැදගත් තොරතුරක් ඉක්මණින් බුද්ධි තොරතුරක් බවට පරිවර්තනය කරගැනීම සඳහා හෝ ඒ පිළිබඳ වැඩිදුර විශ්ලේෂණය කිරීම සඳහා අවශ්‍ය බලධාරීන්ගේ යොමු කිරීමේ මූලික වගකීම පැහැර හැර ඇත්තේ පැමිණිල්ලේ සාක්ෂි අංක **01** බව පෙනී යයි. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් **2019.04.09** වන දින බුද්ධි සමාලෝචන මණ්ඩල රැස්වීමේදී ආරම්භක දේශනය කරන අවස්ථාවේදී මෙම කරුණ සම්බන්ධයෙන් බුද්ධි සමාලෝචන මණ්ඩලයේ අවධානයට ලක් කිරීම පැහැර හැර එය ජාතික බුද්ධි ප්‍රධානී වෙත පැවරීමට ඔහු අධිකරණයේදී දරණ ලද උත්සාහය අනුමත කල නොහැකිය. රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් එම තොරතුර වර්ධනය කරගෙන එහි සත්‍ය අසත්‍යතාවය හෝ එවැන්නක් සිදුවීමට ඇති සම්භාවිතාවය පිළිබඳ අවශ්‍ය අනෙකුත් අය සමග සාකච්චාවට බඳුන් කිරීමේ මූලික වගකීම පැමිණිල්ලේ සාක්ෂි අංක **01** සතුව තිබුණු බව පෙනී යයි. විශේෂයෙන්ම යුධ හමුදා බුද්ධි අධ්‍යක්ෂක වශයෙන් කටයුතු කළ පැමිණිල්ලේ සාක්ෂි අංක **1057** පවසා සිටියේ **2019.04.18** වන දින තමාට දුරකතනයෙන් කතා කරන ලද පැමිණිල්ලේ සාක්ෂි අංක **01** මඩකලපුවේ සිදු වූ පිපිරීමක් සම්බන්ධයෙන් සාකච්චා කළද, **2019.04.04** ලද තොරතුර සම්බන්ධයෙන් කිසිදු දැනුම් දීමක් නොකල බවයි. විශේෂයෙන්ම එම සාක්ෂිකරු වැඩිදුරටත් පවසා සිටියේ රාජ්‍ය බුද්ධි සේවය කිසිදු අවස්ථාවක බුද්ධි තොරතුරු හුවමාරු කරගැනීමට උත්සාහ නොකළ බවත්, යුධ හමුදා බුද්ධි අංශය සමග රාජ්‍ය බුද්ධි සේවයේ සහයෝගයෙන් කටයුතු නොකළ බවත්ය.*

*එසේම සාක්ෂිකරුගේ අවබෝධ අනුව පවසා සිටියේ මෙම කාලසීමාව තුළ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයාට ජනාධිපතිවරයා සමග නිසි ලෙස සම්බන්ධවීමේ හැකියාවක් තිබුණු බවයි".*

තවද HC(TAB)2900/21 දරණ නඩුවේ ද 2022.02.18 දින දරණ නියෝගය ලබාදෙමින් එ.කේ.එම්. පටබැදිගේ විනිසුරුතුමා දක්වා ඇත්තේ 2019.04.04 දින දරණ තොරතුර බුද්ධි තොරතුරක් දක්වා වර්ධනය කරගැනීම සඳහා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා යුධ හමුදා බුද්ධි අංශයෙන් හෝ ත්‍රිවිධ හමුදා වල බුද්ධි අංශ වලින් කිසිදු සහයක් ලබාගැනීමට කටයුතු කර නැති බවයි. HC (TAB)2900/2021 දරණ නඩුවේ 2022.02.18 දරණ නියෝගයේ 235 ඡේදයේ මෙය සඳහන් වන අතර එම ඡේදය අඩංගු නියෝගයේ මුල් පිටුවේ සත්‍ය පිටපතක් **"D"** ලෙසද 235 ඡේදය අඩංගු පිටුවේ සත්‍ය පිටපතක් **"D (1)"** ලෙස ද ලකුණු කොට මෙයට අමුණා ඇත.

***"235.** මෙහිදී මෙම තොරතුර බුද්ධි තොරතුරක් දක්වා වර්ධනය කර ගැනීම සඳහා රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා වශයෙන් යුධ හමුදා බුද්ධි අංශයෙන් හෝ ත්‍රිවිධ හමුදාවල බුද්ධි අංශ වලින් අවශ්‍ය කිසිදු සහයක් ලබා ගැනීමට කටයුතු කර නැත. පැමිණිල්ල වෙනුවෙන්ම කැඳවන ලද වර්තමාන පොලිස්පතිවරයාගේ සාක්ෂියට අනුව එසේ ත්‍රිවිධ හමුදා බුද්ධි අංශ සමග සාකච්චා කර බුද්ධි තොරතුරු හුවමාරු කර ගැනීමට, විශ්ලේෂණය කිරීමට බුද්ධි අධ්‍යක්ෂකවරයාට බාධාවක් නැත. ඔහු ශ්‍රී ලංකා පොලීසියේ බුද්ධි අධ්‍යක්ෂකවරයා නොව රාජ්‍ය බුද්ධි සේවයේ බුද්ධි අධ්‍යක්ෂකවරයා වේ. එබැවින් ලැබෙන තොරතුරු බුද්ධි තොරතුරු බවට පරිවර්තනය කර ගැනීම සම්බන්ධයෙන් සුවිශේෂී වගකීමක් ඇත්තේ රාජ්‍ය බුද්ධි අධ්‍යක්ෂකවරයාට වේ".*

එසේම මෙම පාස්කු ඉරුදින ත්‍රස්ත ප්‍රහාරය සිදු වන අවස්ථාවේදී ශ්‍රී ලංකා පොලිසියේ අපරාධ විමර්ශන දෙපාර්තමේන්තුවේ (CID) අධ්‍යක්ෂ තනතුර හොබවන ලද දැනට විශ්‍රාම ගොස් සිටින ශානි අබේසේකර මහතා විසින් මෙම ත්‍රස්ත ප්‍රහාරය සම්බන්ධයෙන් විමර්ශන සිදු කරන ලද අතර ඔහු විසින් පවරා ඇති SCFR 64/2022 දරණ මූලික අයිතිවාසිකම් නඩුවේ පෙත්සමත් සමග ගොනු කර ඇති දිවුරුම් ප්‍රකාශයේ වෙනත් කරුණු අතර නිලන්ත ජයවර්ධන මහතා සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව පහත සඳහන් සාක්ෂි අන්තර්ගතව ඇත.

මෙම දිවුරුම් ප්‍රකාශයේ සත්‍ය පිටපතක් **"E"** ලෙස ලකුණු කොට මේ සමග අමුණා ඇත.

මෙම දිවුරුම් ප්‍රකාශයේ 2019.01.16 හෝ ඊට ආසන්න දිනකදී එනම් පාස්කු ප්‍රහාරය සිදුවීමට මාස 3කට පෙර ලැක්ටෝවත්තේදී අත්අඩංගුවට ගන්නා ලද සහරාන් නායකත්වය දරණ ලද NTJ ත්‍රස්තවාදී සංවිධානයේ සාමාජිකයන් වන සැකකරුවන් 4 දෙනෙකුගෙන් අනාවරණ කරගන්නා ලද කරුණු දැක්වේ. එම අනාවරණය කරගන්නා ලද කරුණු වලට ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති නිලන්ත ජයවර්ධන මහතා අධ්‍යක්ෂක ධූරය දරණ ලද රාජ්‍ය බුද්ධි සේවයේ (SIS) නිලධාරීන්ට ද ප්‍රවේශය තිබුණු බවට මෙම දිවුරුම් ප්‍රකාශයේ දැක්වේ.

දිවුරුම් ප්‍රකාශයේ 37 වන සම්ප්‍රකාශයේ දැක්වෙන ආකාරයට,

***"The Petitioner further states that the officers of the SIS and DMI were also given permission to interrogate the aforementioned 4 suspects who were arrested from the Lactowatte raid and to examine and take photographs of the productions of the NTJ" ("...ලැක්ටෝවත්ත වැටලීමේදී අත්අඩංගුවට ගත් ඉහත කී සැකකරුවන් හතර දෙනාගෙන් ප්‍රශ්න කිරීමටත් NTJ නිෂ්පාදන පරීක්ෂා කර ඡායාරූප ගැනීමටත් SIS සහ DMI නිලධාරීන්ට ද අවසර ලබා දී ඇති බව පෙත්සම්කරු තවදුරටත් පවසයි").***

දිවුරුම් ප්‍රකාශයේ 35 වන සම්ප්‍රකාශයේ දැක්වෙන ආකාරයට 2019.01.16 හෝ ඊට අසන්න දිනකදී ලැක්ටෝවත්තේදී අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හතර දෙනාගෙන් අනාවරණය කරගන්නා ලද කරුණු පහත පරිදි වේ.

- ***"M.C.M. Saharan was the leader of the NTJ (එම්.සී. එම්. සහරාන් NTJ නායකයා විය).***
- ***That M.C.M. Saharan has conducted extremist preaching and workshops (එම්.සී. එම්. සහරාන් අන්තවාදී දේශනා සහ වැඩමුළු පවත්වා ඇති බව),***
- ***That M.C.M. Saharan has conducted short training courses to NTJ members relating to weapons in Nuwara Eliya (එම්.සී. එම්. සහරාන් නුවරඑළියේ ආයුධ සම්බන්ධයෙන් NTJ සාමාජිකයින්ට කෙටි පුහුණු පාඨමාලා පවත්වා ඇති බව),***
- ***That all the members in NTJ were given an alias apart from their original name (NTJ හි සියලුම සාමාජිකයින්ට ඔවුන්ගේ මුල් නමෙන් අන්වර්ථ කොටසක් ලබා දී ඇති බව),***
- ***That the members of this organization have been categorized under two teams as Suicide Attackers and Lone Wolf Attackers (මෙම සංවිධානයේ සාමාජිකයින් මරාගෙන මැරෙන ප්‍රහාරකයින් සහ හුදකලා ප්‍රහාරයන් ලෙස කණ්ඩායම් දෙකක් යටතේ වර්ග කර ඇති බව),***
- ***That M.C.M. Saharan and head members of the organization has engaged in collecting weapons and manufacturing explosives in Lactowatte, Puttalam (එම්.සී. එම්. සහරාන් සහ එම සංවිධානයේ ප්‍රධානින් පුත්තලම ලැක්ටෝවත්ත ප්‍රදේශයේ ආයුධ එකතු කිරීමේ සහ පුපුරණ ද්‍රව්‍ය නිෂ්පාදන කිරීමේ නිරතව ඇති බව),***
- ***That M.C.M. Saharan has planned to establish a training camp at Lactowatte. (එම්.සී. එම්. සහරාන් ලැක්ටෝවත්තේ පුහුණු කඳවුරක් පිහිටුවීමට සැලසුම් කර ඇති බව)."***

දිවුරුම් ප්‍රකාශයේ 36 වන සම්ප්‍රකාශයේ දැක්වෙන ආකාරයට,

***"The Petitioner further states that from the interrogations conducted on A.H.M. Mufiz and A.H.M. Hamas, the CID investigation officers were able to reveal that the person named M.C.M. Saharan is intending to carry out several extremist activities in Sri Lanka in order to cause communal disharmony" ("පෙත්සම්කරු වැඩිදුරටත් පවසන්නේ ඒ.එච්.එම්. මුෆීස් සහ ඒ.එච්.එම්. හමාස්, ගෙන් සිදු කළ ප්‍රශ්න කිරීම්වලින් එම්.සී.එම්. සහරාන් ශ්‍රී ලංකාව තුළ ජාතිවාදී අසමගිය ඇති කිරීම සඳහා අන්තවාදී ක්‍රියාකාරකම් කිහිපයක් සිදු කිරීමට අදහස් කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ විමර්ශන නිලධාරීන්ට හෙළිකර ගැනීමට හැකි වූ බවයි).***

මේ අනුව සහරාන් සහ NTJ කණ්ඩායම සම්බන්ධයෙන් විශාල දැනුමක් 2019 ජනවාරි මස වන විටත් SIS අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතාට තිබුණු බව ශානි අබේසේකර මහතාගේ මෙම දිවුරුම් පෙත්සමෙන් අනාවරණය වේ. ඒ අනුව මෙවන් දැනුමක් SIS අධ්‍යක්ෂක නිලන්ත ජයවර්ධන මහතා වෙත තිබුණු පසුබිමක ඔහුට ලැබුණු 2019.04.04 දින දරණ 'වට්ස්ඇප්' පණිවිඩය බරපතල කරුණක් ලෙස සළකා ඒ පිළිබඳව ක්‍රියාත්මක නොවීම ඔහු කෙරෙහි සාධාරණ සැකයක් උපදවයි.

මෙම දිවුරුම් ප්‍රකාශයේ 64 වන සම්ප්‍රකාශයේ සඳහන් වන සාක්ෂි වලට අනුව පාස්කු ප්‍රහාරයෙන් පැය කිහිපයකට පසු රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂකවරයා ලෙස නිලන්ත ජයවර්ධන විසින් ප්‍රථම වරට CID වෙත යවා ඇති NTJ ත්‍රස්තවාදී සංවිධානයේ අණදෙන ව්‍යුහය පිළිබඳ සම්පූර්ණ තොරතුරු සහ වව්නතිව් පොලිස් කොස්තාපල්වරු දෙදෙනා ඝාතනය සම්බන්ධයෙන් සාක්ෂි ඇතුලත් වාර්තාව ත්‍රස්ත ප්‍රහාරය එල්ල කිරීමට පෙර CID වෙත හෝ ආරක්ෂක මණ්ඩලයට නිලන්ත ජයවර්ධන මහතා විසින් ලබාදුන්නේ නම් මෙම ප්‍රහාරය වැලැක්වීමට හැකියාව තිබී ඇත.

එම 64 වන සම්ප්‍රකාශය පහත සඳහන් වේ.

***"The Petitioner further states that he became aware that the then SDIG SIS Nilantha Jayawardena, has sent a report to the CID for the first time providing full details of the NTJ***

***command structure and evidence of their involvement in the killings of the two Police Constables in Vavunathivu a few hours after the Easter Attacks. The Petitioner states that the CID has been searching for M.C.M. Saharan for the past four months with no support from the Intelligence Services and if this specific information related to the NTJ Command structure and the murder of the two constables in Vavunathivu were made available to CID or provided to the Security Council prior to the attacks by the then SDIG SIS Nilantha Jayawardena it may have been possible to prevent the attacks".(පොලිස් කොස්තාපල්වරුන් දෙදෙනාගේ ඝාතනවලට NTJ අණදෙන ව්‍යුහය පිළිබඳ සම්පූර්ණ තොරතුරු සහ සාක්ෂි ඇතුළත් වාර්තාවක් එවක SDIG SIS නිලන්ත ජයවර්ධන විසින් පළමු වරට පාස්කු ප්‍රහාරයෙන් පැය කිහිපයකට පසු CID වෙත යවා ඇති බව තමා දැනගත් බව පෙත්සම්කරු වැඩිදුරටත් පවසයි. පෙත්සම්කරු පවසන්නේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පසුගිය මාස 4 තුළ බුද්ධි අංශවල සහය නොමැතිව එම්.සී.එම්. සහරාන් සොයමින් සිටි බව සහ NTJ අණදෙන ව්‍යුහය සහ වවුනතිව් කොස්තාපල්වරුන් දෙදෙනා ඝාතනය සම්බන්ධයෙන් මෙම නිශ්චිත තොරතුරු ප්‍රහාර එල්ල කිරීමට පෙර CID වෙත හෝ ආරක්ෂක මණ්ඩලයට SDIG SIS නිලන්ත ජයවර්ධන විසින් ලබාදුන්නේ නම්, ප්‍රහාර වැලැක්වීමට හැකි වන්නට ඇති බවයි").***

ඉහත කරුණු වලට අගතියක් නොවන ලෙස වැඩිදුරටත් දක්වා සිටින්නේ රාජ්‍ය බුද්ධි සේවයේ අධ්‍යක්ෂක ලෙස නිලන්ත ජයවර්ධන මහතා හට පාස්කු ඉරුදින ප්‍රහාරය පිළිබඳ 2019.04.04 දින දරණ 'වට්ස්ඇප්' මගින් ලැබුණු පණිවිඩය එම තොරතුරුකරු විසින් නැවතත් ලිඛිතව 2019.04.05 වන දින උදේ 9.00 ට ලබා දී ඇති අතර වෙනත් විදේශීය තොරතුරුකරුවෙකු විසින් ද එදිනම දවල් 12.00 ට ලිඛිතව එම තොරතුර නිලන්ත ජයවර්ධන මහතා හට ලබා දී ඇත. මේ අනුව අදාළ තොරතුර ස්වාධීන තොරතුරුකරුවෙකු විසින් තහවුරු කරන ලද තොරතුරක් වන බැවින් එය විශ්වාසදායක තොරතුරක් බවට පරිවර්තනය කරන ලද්දක් ලෙස සැලකිය යුතුය. එසේ නම් නිලන්ත ජයවර්ධන මහතා මේ පිළිබඳ ක්‍රියාත්මක නොවීම අතිශයින්ම බරපතළ වරදකි.

මෙලෙස 2019.04.04 වන දින ලද 'වට්ස්ඇප්' මගින් ලැබුණු තොරතුර විදේශීය තොරතුරුකරුවෙකු විසින් ද 2019.04.05 වන දින ලබාදුන් බවට නිලන්ත ජයවර්ධන මහතා විසින් HC (TAB) 2899/21 දරණ නඩුවේ දී දිවුරුම් පිට සාක්ෂි ලබාදී ඇති අතර මෙම නඩුවේ 2021.11.24 වන දින ප.ව 01.50 සටහනේ 5 සහ 6 පිටු වල අඩංගු නිලන්ත ජයවර්ධන මහතාගේ සාක්ෂිය පහත දැක්වෙන අතර එම දිනයට සහ වේලාවට අදාළ සටහන් **"F"** ලෙසත් එම අදාළ සාක්ෂි කොටස ඇති පිටුව **"F (1)"** ලෙසත් ලකුණු කොට මෙයට අමුණා ඇත.

***"ප්‍ර. තොරතුරුකරුගෙන් මේ ගැන වැඩිදුර දෙයක් ඉන්පසු ලැබුනාද?***

***උ. තොරතුරුකරුගෙන් ලිඛිතව ඉල්ලුවා. මට ලිඛිතව මෙය ලබාදෙන්න කියලා.***

***ප්‍ර. ඒ අනුව ඔවුන් ලිඛිතව ලබා දුන්නද?***

***උ. තොරතුරුකරු මට ලිඛිතව 05 වෙනිදා උදේ 9.00 ට ලබා දුන්නා. ඊට පස්සේ වෙනත් විදේශයේ තොරතුරුකරුවෙකුත් මට එය දවල් 12.00 ට ලිඛිතව මම ලබා ගත්තා.***

***ප්‍ර. ඒ ලබාදුන්නෙත් මේ කරුණුමද?***

***උ. ඒ කරුණුමයි ස්වාමිනී. එමමයි.***

***ප්‍ර. ඊට වැඩිමනක් යමක් ලබා දුන්නේ නැහැ?***

සටහන් **"F"** ලෙසත් එම අදාළ සාක්ෂි කොටස ඇති පිටුව **"F (1)"** ලෙසත් ලකුණු කොට මෙයට අමුණා ඇත.

*"ප්‍ර. තොරතුරුකරුගෙන් මේ ගැන වැඩිදුර දෙයක් ඉන්පසු ලැබුනාද?*

*උ. තොරතුරුකරුගෙන් ලිඛිතව ඉල්ලුවා. මට ලිඛිතව මෙය ලබාදෙන්න කියලා.*

*ප්‍ර. ඒ අනුව ඔවුන් ලිඛිතව ලබා දුන්නද?*

*උ. තොරතුරුකරු මට ලිඛිතව 05 වෙනිදා උදේ 9.00 ට ලබා දුන්නා. ඊට පස්සේ වෙනත් විදේශයේ තොරතුරුකරුවෙකුත් මට එය දවල් 12.00 ට ලිඛිතව මම ලබා ගත්තා.*

*ප්‍ර. ඒ ලබාදුන්නෙත් මේ කරුණුමද?*

*උ. ඒ කරුණුමයි ස්වාමීනී. එමමයි.*

*ප්‍ර. ඊට වැඩිමනක් යමක් ලබා දුන්නේ නැහැ?*

*උ. නැහැ ස්වාමීනී.*

*ප්‍ර. එදා දවසේ ඒ කියන්නේ ඔබ ඒ ලිඛිතව ලැබුනේ 5 වෙනිදා කියලා කිව්වා?*

*උ. 05 වෙනිදා උදේ 9.00 ට එකකුත් දවල් 12.00ට තව එකකුත් ලැබුනා."*

ඒ අනුව ඉහත ඉදිරිපත් කරන ලද දිවුරුම් පිට ලබාදෙන ලද සාක්ෂි සහ දිවුරුම් ප්‍රකාශ වල අඩංගු සාක්ෂි වලින් අනාවරණය වන කරුණු මත පදනම්ව 2019.04.21 දින සිදු වූ පාස්කු ප්‍රහාරය සිදු වන බවට තොරතුරු ලැබී තිබියදීත් එකී තොරතුරු වල සඳහන් වරද සිදු කිරීම වැලැක්වීමට ක්‍රියා නොකිරීමෙන් දණ්ඩ නීති සංග්‍රහයේ 100 වගන්තියේ (iii) වන ශීර්ෂයේ සඳහන් වරදක් සිදු කිරීම සම්බන්ධයෙන් ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දීගොඩගමගේ නිලන්ත ජයවර්ධන මහතාට විරුද්ධව අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ විමර්ශනයක් ආරම්භ කරන ලෙසට විශේෂ විමර්ශන ඒකකයට නියෝගයක් කරන ලෙස ද, ඔහුව අත්අඩංගුවට ගෙන නිතිය ක්‍රියාත්මක කරන ලෙස ද, පහත අත්සන් කරන අප සියලු දෙනා ඔබගෙන් ඉල්ලා සිටිමු.

1. රොහාන් සිල්වා පියතුමා
2. ජුලියන් පැට්‍රික් පියතුමා
3. රොෂාන් සිල්වා පියතුමා Fr. N Roshan Silva. omi
4. රසිකා පෙරේරා කන්‍යා සොයුරිය
5. දීපා ප්‍රනාන්දු කන්‍යා සොයුරිය

සියලු දෙනාම 281, ඩීන්ස් පාර, කොළඹ 10. 2022.04.20